**රුහුණ විශ්වවිද්‍යාලය**

**තාක්ෂණ පීඨය/ගම්උදාව, කඹුරුපිටිය**

**<u>ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා කුලී පදනම මත වාහන (කාර් රථ සහ වෑන් රථ) ලබා ගැනීම</u>**

කඹුරුපිටිය,ගම්උදාව පිහිටි රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ භාවිතය සඳහා ඩීසල්/පෙට්‍රල් වලින් ධාවනය වන වායු සමනය සහිත ආසන 04ක් සහිත කාර් රථ සහ ද්වි කාර්යය/මගී යටතේ ලියාපදිංචි කළ ඉදිරිපස/ද්විත්ව වායු සමනය සහිත වෑන් රථ කුලී පදනම මත සැපයීමට හැකි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

කාර් රථ නිෂ්පාදිත වර්ෂයේ සිට වසර 06ක් ඉකුත් නොවිය යුතු අතර වෑන් රථ නිෂ්පාදිත වර්ෂයේ සිට වසර 12ක් ඉකුත් නොවිය යුතු ය.

අදාළ අයදුම්පත් ආපසු නොගෙවන රු.500.00ක මුදලක් මහජන බැංකුව - කඹුරුපිටිය ශාඛාවේ තාක්ෂණ පීඨයේ ගිණුම් අංක 133100140070650ට ගෙවා ලබාගත් ලදුපත ඉදිරිපත් කිරීමෙන් සහකාර ලේඛකාධිකාරී,තාක්ෂණ පීඨය වෙතින් 2021.11.05 දින ප.ව. 2.00 දක්වා ලබා ගත හැකිය.අවශ්‍ය වැඩිදුර විස්තර සඳහා සහකාර ලේඛකාධිකාරි, තාක්ෂණ පීඨය සම්බන්ධ කර ගන්න.(041-2294754)

අයදුම්පත් සමග වාහනය ලියාපදිංචි කිරීමේ සහතිකය, අදාළ වර්ෂයේ ආදායම් බලපත්‍රය, පූර්ණ රක්ෂණ සහතිකය, අදාළ රියදුරු මහතාගේ රියදුරු බලපත්‍රය සහ වාහන හිමිකරුගේ ජාතික හැඳුනුම්පත යන ලේඛනයන්හි සහතික කළ ඡායා පිටපත් ඉදිරිපත් කල යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2021.11.07 දින ප.ව.4.00**ට හෝ ඊට ප්‍රථම සහකාර ලේඛකාධිකාරී, තාක්ෂණ පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, ගම්උදාව ,කඹුරුපිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර ගෙනවිත් භාරදෙන්නේ නම්, ඔබගේ ටෙන්ඩර්පත නියමිත දින නියමිත වේලාවට පෙර රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ පීඨ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ටෙන්ඩර් ලියවිලි බහාලන කවරයේ වම්පස ඉහල කෙළවරේ ***''තාක්ෂණ පීඨය සඳහා කුලී පදනම මත වාහන සැපයීම''*** යනුවෙන් සඳහන් කළ යුතුය.

2021.11.08 වන දින පෙ.ව.8.00ට ටෙන්ඩර්පත් විවෘත කරන අතර එම අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකිය.

අපැහැදිලි, අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර්පත් කිසිඳු හේතුවක් නොදන්වා විශ්වවිද්‍යාලය මගින් ප්‍රතික්ෂේප කරනු ලබන අතර රුහුණ විශ්වවිද්‍යාලයීය ටෙන්ඩර් මණ්ඩලය ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

ලේඛකාධිකාරී
රුහුණ විශ්වවිද්‍යාලය